කොළඹ 02.

02-279

## සමාගමේ නම වෙනස් කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 (2) ඡේදය ප්‍රකාර කරන දැනුම් දීමයි.

සමාගමේ කළින් නම : සීසේල් කෘෂසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 72296
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 03, විජය කුමාරතුංග මාවත, කොළඹ 05.
සමාගමේ අලුත් නම : ඔරේන්ජ් ග්‍රීන් ඉකෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
නම වෙනස් කළ දිනය : 2012 ඔක්තෝබර් 16.

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2012 ඔක්තෝබර් මස 25 වැනි දින,
අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.

02-278

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

සමාගමේ නම : තුරුශක්ති (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 88992
ලියාපදිංචි ලිපිනය : අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

ක්‍රිශාන්ති එම්මානුවෙල් මෙනවිය,
සමාගමේ ලේකම්.

02-276/1

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (2) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් නාමය වෙනස් කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : එල්. ඕ. එල්. සී. මයික්‍රො ෆිනෑන්ස් ෆන්ඩ් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී බී 4686
ලියාපදිංචි ලිපිනය : අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය
සමාගමේ නව නාමය : එල්. ඕ. එල්. සී. මයික්‍රො ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්.

ක්‍රිශාන්ති එම්මානුවෙල් මෙනවිය,
සමාගමේ ලේකම්.

02-276/2

## ඇටර්නි බලය අවලංගු කිරීම

පහත අත්සන් කරන කඳාන, පොල්පිතිමූකලාන, කොස්පැලැන, අංක 471 දරන ස්ථානයේ පදිංචි ලලිත් චන්ද්‍රසෝම ගනේගොඩ වන මා විසින් කොළඹ 13, කොටහේන, පරමානන්ද විහාර මාවත, අංක 63 ඒ දරන ස්ථානයේ පදිංචි ඉන්ද්‍රා මාලනී ගනේගොඩ යන අය වෙත ප්‍රදානය කරන ලද ඉතාලියේ පළමු ලේකම් සහ සාමදාන විනිසුරු වන ඩබ්ලිව්. එස්. පෙරේරා විසින් 1999.10.19 වැනි දින සහතික කරන ලද ඇටර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බවත්, එකී ඉන්ද්‍රා මාලනී ගනේගොඩ යන අය මාගේ ඇටර්නි බලකරු වශයෙන් තව දුරටත් ක්‍රියා නොකරන බවත් මෙතැන් පටන් ඇය විසින් එළඹෙන කවර හෝ ගනු දෙනුවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ආණ්ඩුවටත් මහ ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

ලලිත් චන්ද්‍රසෝම ගනේගොඩ.

2013 ජනවාරි මස 22 වැනි දින.

02-270

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ ප්‍රෙස්ටීජ් ග්‍රැෆික්ස් ලේබල් සොලූෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2012 නොවැම්බර් මස 29 වැනි දින ලියාපදිංචි කළ අතර, එකී සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තිය යටතේ ප්‍රෙස්ටීජ් ග්‍රැෆික්ස් ලේබල් සොලූෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් නාමය වෙනස් කරන ලදුව 2012 දෙසැම්බර් මස 20 වැනි දින නැවත ලියාපදිංචි කරන ලදී.

ලියාපදිංචි අංකය : පී වී 89621
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 76, රාගම පාර, ඇලපිටිවල, රාගම

සමාගම් ලේකම්.

02-205

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා පවර් 2 (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ නම දොලේකන්ද පවර් (පීවීටී) එල්ටීඩී වශයෙන් නම වෙනස් කිරීම 2012 දෙසැම්බර් මස 20 වැනි දින සංස්ථාපනය කිරීම පිළිබඳව මෙයින් දැනුම් දෙන්නෙමු.

සමාගමේ පෙර පැවති නම : ශ්‍රී ලංකා පවර් 2 (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 70023
ලියාපදිංචි ලිපිනය : ලෙවල් 3, ප්‍රින්ස් ඇල්ෆ්‍රඩ් ටවර් 10, ඇල්ෆඩ් හවුස් ගාඩන්ස්, කොළඹ 03
සමාගමේ නව නාමය : දොලේකන්ද පවර් (පීවීටී) එල්ටීඩී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග ප්‍රකාර,

සිලෝන් සෙක්‍රටේරියල් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

02-226

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1. සමාගමේ නම : සීමාසහිත ටියරඩ්‍රොප් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම
2. සංස්ථාගත කළ දිනය : 2012.12.24
3. සමාගමේ අංකය : පී. වී. 90137
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 30/84, පෙරේරා උද්‍යානය, පෙරේරා මාවත, පැලවත්ත, බත්තරමුල්ල.

සීමාසහිත ටියරඩ්‍රොප් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්.

02-225

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ෂාමිලාස් බියුටි ෆ්‍රී පුද්ගලික සමාගම
සමාගමේ අංකය : පී වී 60372
ලියාපදිංචි ලිපිනය : අංක 410/11, බුලර්ස් පාර, කොළඹ 07.

02-222

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ සංස්ථාපනය කිරීමක් පිළිබඳ නිවේදනය

සමාගමේ නම : බ්‍රාවෝ හෝල්ඩිංස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 89898
ලියාපදිංචි කළ දිනය : 2012 දෙසැම්බර් 12
ලියාපදිංචි අංකය : ලෙවල් 3, අංක 285, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 3

ලේකම්වරු.

02-223

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ රිලයන්ස් ඉන්ෂුරන්ස් ඒ ඒ ජී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගමේ නාමය රිලයන්ස් ඒ ඒ ජී ඉන්ෂුරන්ස් බ්‍රෝකර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කර වර්ෂ 2012 ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ කළින් නම : රිලයන්ස් ඉන්ෂුරන්ස් ඒ ඒ ජී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 60517
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 78, රොස්මිඩ් පෙදෙස, කොළඹ 07
සමාගමේ අලුත් නම : රිලයන්ස් ඒ ඒ ජී ඉන්ෂුරන්ස් බ්‍රෝකර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව

කෝ- සර්ව (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

02-224

---

### සමාගම් පනතේ 334 (2) වගන්තිය අනුව දැන්වීමයි

ටෝටල් ක්‍රෙඩිට් සොලියුෂන්ස් සමාගමේ ණයහිමියන්ගේ රැස්වීම 2013 පෙබරවාරි මස 05 වැනි දින පෙ. ව. 8.30 ට අංක 101, ගාලු පාර, කොළඹ 4 දරන ස්ථානයේ පැවැත්වේ.

සමාගම් ලේකම්වරු.

02-210

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වගන්තිය ප්‍රකාර හයිඩ්‍රෝ පවර් ෆ්‍රී ලංකා 2 (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ නම තෙබුවන හයිඩ්‍රෝ පවර් (පීවීටී) එල්ටීඩී වශයෙන් නම වෙනස් කිරීම 2012 දෙසැම්බර් මස 20 වැනි දින සංස්ථාපනය කිරීම පිළිබඳව මෙයින් දැනුම් දෙන්නෙමු.

සමාගමේ පෙර පැවති නම : හයිඩ්‍රෝ පවර් ෆ්‍රී ලංකා 2 (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 70022
ලියාපදිංචි ලිපිනය : ලෙවල් 3, ප්‍රින්ස් ඇල්ෆ්‍රඩ් ටවර් 10, ඇල්ෆ්‍රඩ් හවුස් ගාඩන්ස්, කොළඹ 03
සමාගමේ නව නාමය : තෙබුවන හයිඩ්‍රෝ පවර් (පීවීටී) එල්ටීඩී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග ප්‍රකාර,

සිලෝන් සෙක්‍රටේරියල් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

02-227

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 වගන්තිය ප්‍රකාර හයිඩ්‍රෝ පවර් ෆ්‍රී ලංකා 3 (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ නම ස්ටෙලන්බර්ග් හයිඩ්‍රෝ පවර් (පීවීටී) එල්ටීඩී වශයෙන් නම වෙනස් කිරීම 2012 දෙසැම්බර් මස 20 වැනි දින සංස්ථාපනය කිරීම පිළිබඳව මෙයින් දැනුම් දෙන්නෙමු.

සමාගමේ පෙර පැවති නම : හයිඩ්‍රෝ පවර් ෆ්‍රී ලංකා 3 (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 70024
ලියාපදිංචි ලිපිනය : ලෙවල් 3, ප්‍රින්ස් ඇල්ෆ්‍රඩ් ටවර් 10, ඇල්ෆ්‍රඩ් හවුස් ගාඩන්ස්, කොළඹ 03
සමාගමේ නව නාමය : ස්ටෙලන්බර්ග් හයිඩ්‍රෝ පවර් (පීවීටී) එල්ටීඩී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග ප්‍රකාර,

සිලෝන් සෙක්‍රටේරියල් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

02-228

### සියළු දෙනාම මෙයින් දැනගත යුතුය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බෙලිඅත්ත, පුවක්දණ්ඩාව, මැදගොඩ හි පදිංචි කංකානම් පණ්ඩිතගේ ජයතිස්ස (ජා. හැ. ප. අංකය 750040325 V) වන මම ඇටර්නි අධිපති ලෙස මා ලියාපදිංචි අයිතිකරු වන මාගේ අංක 56-5237 දරන කැරවන් වර්ගයේ වැන්රථය පිළිබඳව මාගේ නමින් එකී වාහනයට අදාල සියලු කටයුතු සඳහා මාගේ නිත්‍යානුකූල ඇටර්නි බලකරු ලෙස මාතර, පාලටුව, වැල්ලෙතොට, කොහොඹගේන, මල්ලිකා නිවස පදිංචි ජයවර්ධන විදාන පතිරණගේ නිලුපුලා ජීවනී (ජා. හැ. ප. අංකය 807492268 V) යන අය අංක 2115 සහ 2012.03.10 දිනැති බෙලිඅත්ත ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. සේරසිංහ මහතාගේ විශේෂ ඇටර්නි බලපත්‍රය පිට නම්කර පත්කරන ලදිමි.

තවද, එකී පත්කිරීම අවලංගු කිරීම සඳහා වූ විශේෂ කරුණු කාරණා කීපයක් ඇටර්නි අධිපති වන මා හට උද්ගත වී ඇති බැවින් බෙලිඅත්ත ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. සේරසිංහ මහතා විසින් ලියා සහතික කළ අංක 2115 සහ 2012.03.10 දිනැති විශේෂ ඇටර්නි බලපත්‍රය මින් යථා පරිදි අවලංගු කර නිශ්ප්‍රභා කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයේ සියලු දෙනාම මින් දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරමි.

කේ. පී. ජයතිස්ස,
ඇටර්නි අධිපති,

02-235

### හුන්ඩායි ලංකා කොමර්ෂල් වෙහිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2012 දෙසැම්බර් මස 19 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 90046 යටතේ "හුන්ඩායි ලංකා කොමර්ෂල් වෙහිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 28, (2 වැනි තලය) ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02 යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

එම් ඇන්ඩ් ඒ කම්පනි සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ ලේකම්වරු)

අංක 28, (2 වැනි තලය)
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

02-197

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නුගේගොඩ පාගොඩ පාරේ, දියවන්නා උද්‍යානයේ, අංක 23/25 දැනට ඕස්ට්‍රේලියා මෙල්බන් GPO Box 3031 හි පදිංචි වැල්න්ටයින් ෂෙඩන් ප්‍රනාන්දු (ජාතික හැඳුනුම්පත් අංක 670463133 V) වන මා විසින් ලියා අත්සන් කරන ලද නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එන්. ඒ. සෙනෙවිරත්න විසින් කොළඹ වර්ෂ 2012 අප්‍රේල් මස 20 වැනි දින අංක 34 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් බණ්ඩාරවෙල, මීරහාවත්ත, වීරපති හි පදිංචි වීරසිංහ පතිරණගේ තේජාවි දිනූෂා ගුණරත්න වෙත පවරන ලද ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර එම ඇටෝර්නි බලපත්‍රය ආහෝසි කරන බවත් මින් ඉදිරියට වර්ෂ 2012 දෙසැම්බර් මස 23 වැනි දින සිට ඇය විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ගණුදෙනුවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් දන්වා සිටිමි.

වැලන්ටයින් ෂෙඩන් ප්‍රනාන්දු.

2012 දෙසැම්බර් මස 23 වැනි දින.

02-331

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය සීමා යොමු අංකය : 1527/09

මහනුවර, සංඝරාජ මාවතේ, අංක 56 දරන ස්ථානයේ පදිංචි නීසන් බණ්ඩාර ධර්මපාල වැත්තැව මයා හා බුත්සඳ බණ්ඩාර ධර්මපාල වැත්තැව මයා විසින් උකස් කරන ලද දේපළ

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ 2012.06.01 දිනැති අංක 1761 දරන *ගැසට් පත්‍රයේ* හා 2012.05.18 දිනැති "දිනමිණ", "තිනකරන්" හා "ඩේලි නිව්ස්" යන පුවත්පත්වල පළකරන ලද යෝජනාවකට අනුකූලව මුල් මුදල් ශේෂය ද විකිණීම කරන දිනය තෙක් ඒ මත අය විය යුතු පොළිය, ගාස්තු හා එකී ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, හා පරිශ්‍රය පිහිටි ස්ථානයේ දී 2013.03.05 වැනි දින පෙ. ව. 11.00 ට මහනුවර, ටොරිංටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ, යටිනුවර, ගඟවට කෝරළේ, සංඝරාජ මාවතේ පිහිටි මහනුවර, බලයලත් මිනින්දෝරු ඒ. බී. වීරසේකර මයා විසින් සාදන ලද 1986 පෙබරවාරි මස 03 හා අගෝස්තු 18 දිනයන්හි අංක 2352 ඒ දරන පිඹුරේ කැබලි 8 යනුවෙන් පෙන්නුම් කර ඇති, "ෂේඩ් නූක්" යයි හඳුන්වනු ලබන ඉඩමෙන් කොටසක් වන, ඊසාන දෙසට : එම ඉඩමේ ම කැබලි 7 ද, නැගෙනහිර හා ගිනිකොණ දෙසට : බෞද්ධ ප්‍රකාශන මධ්‍යස්ථානය වෙන් කරන බිත්තිය ද, දකුණට : සංඝරාජ මාවත ද, බස්නාහිර හා වයඹ දෙසට : අංක 2352 ඒ දරන මෙම පිඹුරේ කැබලි 09 යනුවෙන් පෙන්නුම් කර ඇති, අඩි පහළොවක පළලැති ප්‍රවේශ මාර්ගය ද මායිම් වූ පර්චස් දහයයි දශම හතයි දෙකක් (අ. 0 රූ. 0 පර්. 10.72) හෝ හෙක්ටයාර් 0.0270ක ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල හා එහි තුළ ඇති සෑම සියලු දේ ද එකී අංක 2352ඒ දරන පිඹුරේ කැබලි 09 යනුවෙන් පෙන්නුම් කර ඇති පාර භාවිතා කිරීමේ අයිතිය ද වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 207/123 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. ඩී. ඒකනායක,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.

02-288

---

**ඩී එෆ් සී සී බැංකුව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 6414 සහ 2735/90/61 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් හතර ඇතුළත අක්මීමන ප්‍රාදේශීය සභා සීමාවට අයත්, පින්නදූව පිහිටි, කළුගල්මාවත, මගේදෙණිය කුඹුර සහ කැටකලගහදූව යාබදව ලෙස හැඳින්වෙන, ලොට් අංක 4 ලෙස දැක්වෙන සීමානිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 0 පර්. 29.50
එහි පිහිටි ගස්වැල් වගාවන්, ගොඩනැගිලි සහ සියල්ල සහිතව.

බද්දේගම ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජේ. ටී. එල්. නන්දන විසින් සහතික කරන ලද, 2010 අප්‍රේල් මස 16 වැනි දිනැති අංක 6414 දරන උකස්කරය ප්‍රකාර සහ පිළිවෙලින් ගාල්ල, කොළඹ, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එම්. එස්. එෆ්. නාදියා, එස්. බස්නායක, සී. පී. ඩබ්ලිව්. මීගහවෙල විසින් සහතික කරන ලද 2011 සැප්තැම්බර් මස 05 වැනි දිනැති, 2011 සැප්තැම්බර් මස 07 වැනි දිනැති, 2011 සැප්තැම්බර් මස 14 වැනි දිනැති අංක 2735/90/61 දරන උකස්කරයන් ප්‍රකාර පින්නදූව නව නගරය පින්නදූව, ගාල්ල යන ස්ථානයේ යූ. කේ. එම්. සුපර් සිටි නම් ව්‍යාපාරය පවත්වාගෙන යන කරසිංහ ආරච්චිගේ සිසිර කුමාර විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2013 පෙබරවාරි මස 28 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 79,000ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011-2442442.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංක : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංක :011-2588176,
ඊ මේල් :schokman@samera1892.com

වෙබ් අඩවිය :www.sandslanka.com

02-258

## ප්‍රසිද්ධ වෙන්දේසිය

කොළඹ දිසා අධිකරණයේ දී ය

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී (පෙර මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්) බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර් අංක 28 ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

නඩු අංකය :
ඩීඑම්බී 00042/08
පටිපාටිය :
සාමාන්‍ය
ස්වභාවය :
උකස් බැදුම්කර

................................පැමිණිලිකරු.

එදිරිව

ගෝනගල ආචාරිගේ චමින්ද පුෂ්ප කුමාර (කුමාර ගෝල්ඩ් හවුස්)
අංක 27/8, කොළඹ පාර, කිරිදිවැල.

..................................විත්තිකරු.

ඉහත අංක දරන නඩුවේ 2010.07.21 වැනි දින ප්‍රකාශයට පත්කරන ලද තීන්දු ප්‍රකාශය අනුව ඉහත අංක දරන නඩුවේ විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු යැයි තීන්දු කරන ලද රුපියල් එක් මිලියන තුන් ලක්ෂ තිස්නව දහස් එකසිය හතලිස් එකයි ශත තිස් නවයක (රු. 1,339,141.39) මුදල සහ ඒ මත අයවිය යුතු පොලිය සහ නඩු ගාස්තු ද ගෙවීම පැහැර හැරීම හේතුවෙන් වර්ෂ 2012.11.06 දාතමින් මා වෙත නිකුත් කරනු ලැබූ අධිකාරී බලපත්‍රය මත මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2013ක් වූ මාර්තු මස 06 වැනි දින ප. ව. 1.00 ට කිරිදිවැල, කොළඹ පාර, කුමාර ගෝල්ඩ් හවුස් අංක 27/8 දරන දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේනය කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ දොම්පෙ ප්‍රාදේශීය සභා සීමාව තුළ කිරිදිවැල පිහිටි නුගගහලන්ද හෙවත් අත්තනගහහේන හෙවත් කුරුදුවත්ත නමැති ඉඩමට ඩී. ඒ. විජේසිංහ බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක ඩබ්ලිව්/2937 සහ වර්ෂ 2001ක් වූ අප්‍රේල් මස 06 වැනි දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 35 බී සඳහා මායිම්, උතුරට : ප්‍රධාන පාර ද, නැගෙනහිරට : කැබලි අංක 35ඒ ද, දකුණට : අංක 1505 දරන පිඹුරේ කැබලි අංක 63 බස්නාහිරට : අංක 1505 දරන පිඹුරේ කැබලි අංක 36 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තුනයි දශම දෙකයි හයයි හතරක් (අ. 0 රූ. 0 පර්. 3 264) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ ගොඩනැගිලි සහ සෑම සියලු දේත් වේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. විකුණුම් මිලෙන් 25% (සියයට විසිපහක්),
2. සියලුම ප්‍රචාරක ගාස්තු,
3. මුද්දර ගාස්තු,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු,
5. ප්‍රාදේශීය සභා ගාස්තු 1 % (සියයට එකක්),
6. වෙන්දේසිකරුගේ ගාස්තු,
7. නොතාරිස් ගාස්තු,
8. ගැණුම් මිලෙන් පළමුවන රු. 7,500 ට රු. 150ක් ද ඊට අමතරව ලැබෙන සෑම රු. 1,000කටම රුපියල් 5 බැගින් වූ අධිකරණයට ගෙවිය යුතු ගාස්තු ද (කණු ගාස්තු)
9. පළාත් පාලන ආයතනයන් විසින් පනවනු ලැබූ වෙනත් බදු ආදිය.

ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල දින 30ක් ඇතුළත ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතු අතර එසේ ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් මුලින් තැන්පත් කරන ලද මුදල් ආපසු නොගෙවන අතර එකී දේපළ නැවත වෙන්දේසියේ තැබීමට ක්‍රියා කරනු ඇත.

අදාළ ඔප්පු සහ ලේඛන පරීක්ෂාව සඳහා කළමණාකරු නීති අයකිරීම් මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර් අංක 28 ශාන්ත මයිකල් පාර, කොළඹ 3 යන ලිපිනයෙන් හෝ දුරකථන අංක 4711711, 4711722, 071-4175944 න් ලබා ගත හැක.

අධිකරණයේ අණ පරිදි,

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු.

02-321

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - ගම්පහ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2005.09.09 වැනි දින සහ 2007.10.16 දින සහ පිළිවෙලින් අංක 5081 සහ 6394 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම් ගම්ලක්ෂගේ දොන් අජිත් නාලන් ධම්මික සෙනෙවිරත්න යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් සහ වෙන්දේසිකරුගේ ගාස්තුව ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013 ක් වූ මාර්තු මස 01 වැනි දින පෙ. ව. 11.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සීමාවේ (අලුත් මාවත) කොට්ඨාස අංක 4 බ්ලුමැන්ඩල් පාරේ පිහිටි ඉඩමට බලයලත් මානක එච්. ඒ. පීරිස් විසින් මැන සාදන ලද 2002.09.19 දිනැති අංක 4847 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් වයි 1 හි පර්චස් පහළොවයි දශම හතරයි අටයි (අ. 0 රූ. 0 පර්. 15.48) විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේත් සමග. යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.12.02 වැනි දින රජයේ ගැසට් පත්‍රය සහ 2011.12.02 වැනි දින ලක්බිම, ඩේලිමිරර් සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.-* මරදාන සිට සංඝරාජ මාවත, ජෝර්ජ් ආර්. ඩී. සිල්වා මාවත සහ ජේතවන පාර පිහිටි හංදියෙන් දකුණට : හැරුණු විට කේ. සිරිල් සී. පෙරේරා මාවත හමුවේ. සාන්ත ජේම්ස් වීදිය හංදියෙන් මීටර් 100ක් ඉදිරියට ගිය විට උතුරු දෙසින් ආදළ ඉඩම වම් අත පැත්තේ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසන් වූ වහාම උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකයි (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු යි. දින 30ක් තුල දි ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයකට (10%) මුදල ආපසු නොගෙවන අතර, දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛන පරික්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා -

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

අංක 182, 3 වැනි උසාවිය පාර, කොළඹ 12.
දුරකථන අංක : 011-2396520
දුරකථන/ෆැක්ස් අංකය : 0112445393
ඊමේල් : senaservice@sltnet.lk

ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අය කිරීම්),
හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී,
අංක 479, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.
දුරකථන අංක : 011-2664664.

02-307

---

## සම්පත් බැංකුව පීඑල්සී
### (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

කේ. එල්. ජී. වසන්ත සහ ඒ. ඩී. කේ. ලියනගේ,
ගිණුම් අංක : 1012 5012 6345.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2012 ජනවාරි මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අසූ පන් ලක්ෂ හාර දහස් නමසිය හයයි ශත විසි නමයක (රු. 85,04,906.29) මුදල ද, 2012 ජනවාරි මස 14 වැනි දින අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙලක්ෂ පනස් හත් දහස් පන්සිය විස්සයි ශත හැත්තෑ හයක (රු. 2,57,520.76) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතයි දශම පහක් (17.5%) රුපියල් තිස් හය ලක්ෂ එකොළොස් දහස් තුන්සිය අසූ නමයයි ශත විසි නමයක (36,11,389.29) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි හතරක් (24%) රුපියල් නම ලක්ෂ විසි අට දහස් අටසිය පනස් හතරයි ශත අටක (රු. 9,28,854.08) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි හයක් (26%) හා තවත් රුපියල් විසි අට ලක්ෂ විසි එක් දහස් නමසිය විසි අටයි ශත හතලිස් අටක ( රු. 28,21,928.48) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතක් (17%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2012.05.11 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2012.04.20 වැනි දින "දිවයින" සහ " තිනකුරල් " සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2013.02.26 වැනි දින පෙ. ව. 11.30 ට අංක 32 A කජුගහවත්ත, ගොතටුව අංගොඩ පෙ. ව. 11.45 ට අංක 70, 4 වැනි පටුමග, කජුගහවත්ත, ගොතටුව, අංගොඩට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ අඹතලෙන් පහළ කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (වෝඩ් අංක 5 කොටිකාවත්ත) ගොතටුව ග්‍රාමයේ පිහිටි "සම්බුද්දි කජුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. සමරවික්‍රම යන අය විසින් සාදන ලද 1999 ඔක්තෝබර් මස 16 දාතම හා අංක 199/1999 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : සම්බුද්ධි කජුගහවත්ත පාර (PP A 4464/184) නැගෙනහිරට : සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද 1986 අප්‍රේල් 10 දාතම හා අංක K O 6304 දරන පී පිඹුරේ එම ඉඩමේ ලොට් 2 සහ අංක 199/1999 දරන එකී පිඹුරේ ලොට් බී, දකුණට : අංක 199/1999 දරන එකී පිඹුරේ ලොට් B සහ බස්නාහිරට : පාර ( PPA 4464/155) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයක් (අ. 0 රූ. 0 පර්. 6) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද, සමග එකී අංක 199/1999 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව B 1082/89 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බැදුම්කර අංක 42, 457, 548. 3548 පරිදි හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ අඹතලෙන් පහළ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ගොතටුව පිහිටි වරිපනම් අංක 18-05, 04 වැනි පටුමගේ "සම්බුද්ධ කජුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. කස්තුරිආරච්චි යන අය විසින් සාදන ලද 2008 අප්‍රේල් 02 දාතම හා අංක 4313 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 79 ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 4464 දරන එකී පිඹුරේ ලොට් 66 සහ 67 නැගෙනහිරට : අංක 4464/ඒ දරන එකී පී පිඹුරේ ලොට් 78, දකුණට: කජුගහවත්ත 4 වැනි පටුමග සහ බස්නාහිරට අංක 4464/ ඒ දරන එකී

පී පිඹුරේ ලොට් 80 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම දෙකයි දෙකක් (අ. 0 රූ. 0 පර්. 15.22) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4313 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 79 ඒ පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී ගොතටුව ග්‍රාමයේ පිහිටි වරිපනම් අංක 70 (කජුගහවත්ත) දරන "සම්බුද්ධ කජුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සහතික ලද 1961 ජුනි 19 දාතම හා අංක ඒ 4464 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 79 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : මෙම ඉඩමේ ලොට් 66 සහ 67 ගිණිකොණට : මෙම ඉඩමේ ලොට් 78 නිරිතට : පාර සහ වයඹට : එම ඉඩමේ ලොට් 80 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම හතරයි අටක් (අ. 0 රූ. 0 පර්. 15.48) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමග එකී අංක 4464 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව බී 1038/53 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බැදුම්කර අංක 459 පරිදි හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

02-308